පොදු චක්‍රලේඛ 03/2023

මගේ අංකය- DCDSP/02/18/04
සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව,
පෙට්ටිගලවත්ත,
ගාල්ල.
2023.07.14

දකුණු පළාතේ සියළුම සමුපකාර සමිතිවල ලේකම්වරුන් වෙත,

**සමුපකාර සමිතියක ධූරයක් සඳහා තේරී පත්වන/පත් කරනු ලබන හෝ නම් කරනු ලබන නිලධාරීන් ධූරය භාර ගැනීමෙන් පසු ඉදිරිපත් කල යුතු ප්‍රකාශ /ලේඛණ සම්බන්ධව.**

දකුණු පළාත තුළ ලියාපදිංචි සෑම සමුපකාර සමිතියකම කාරක සභාවකට/ අධ්‍යක්ෂ මණ්ඩලයකට/ ප්‍රාදේශික හෝ දිස්ත්‍රික් කාරක සභාවකට සාමාජික ඡන්දයෙන් තේරී පත් වන හෝ එකී ධූරයක් සඳහා සමුපකාර සංවර්ධන කොමසාරිස්/රෙජිස්ට්‍රාර් විසින් පත් කරනු ලබන/ නම් කරනු ලබන සෑම නිලධාරියෙකුම එකී තනතුර සඳහා තේරී පත්වූ/ පත් කරනු ලැබූ / නම් කරනු ලැබූ දින සිට දින 07 ක් ඇතුලත, තමා එසේ තෝරා පත් කරනු ලැබීමට/ පත් කරනු ලැබීමට/ නම් කරනු ලැබීමට නුසුදුසු නොවන බවට 1973 සමුපකාර සමිති රීති මාලාවේ 21.(iv) රීතිය අනුව මේ සමඟ අමුණා ඇති ආකාරයේ ආකෘතියක වන ප්‍රකාශයක් අනිවාර්යයෙන්ම කළ යුතු අතර එකී ප්‍රකාශය සමිතියේ ලේකම් වෙත ලියාපදිංචි තැපෑලෙන් යොමු කිරීම හෝ ලිඛිතව භාර දීම කල යුතුවේ.

02. ඒ අනුව සමුපකාර සමිතියක ධූරයක් සඳහා ඉහත සඳහන් ඕනෑම ආකාරයකින් පත් වන සෑම නිලධාරියෙකුගෙන්ම එකී ප්‍රකාශය නියමිත දිනට පෙර ගෙන්වා ගැනීම, සමිතියේ සාමාන්‍යාධිකාරී/ කළමණාකරු සමඟ එක්ව, එකී ප්‍රකාශය කිරීම සඳහා හඳුන්වා දී ඇති ආකෘතියේ සඳහන් සියළුම කරුණු/ දත්ත නිවැරදිව සඳහන් කර අත්සන් තබා සහතික කර ඇත්දැයි පරීක්ෂා කර භාර ගැනීම මෙන්ම එකී ප්‍රකාශයන් ආරක්ෂා සහිතව ගොනු කර තබා ගැනීමට ඔබ විසින් කටයුතු කල යුතු අතර, අදාල ප්‍රකාශ අවශ්‍ය අවස්ථාවන්හිදී කොමසාරිස්වරයා/ සහකාර කොමසාරිස්වරයා වෙත හෝ ඔවුන්ගෙන් බලය පවරන ලද දෙපාර්තමේන්තු නිලධාරියෙකු වෙත ඉදිරිපත් කිරීම ඔබගේ වගකීමක් වේ.

03. සමිතිය සඳහා නව නිලධාරියෙකු/ නිලධාරි මණ්ඩලයක් පත්වූ පසු ඔවුන්ගේ අත්සන් සහතික කර අදාල මූල්‍ය ආයතන වෙත යොමු කිරීම සඳහා මා වෙත යොමු කිරීමේදී අදාල නිලධාරියා/නිලධාරීන් මෙම ප්‍රකාශය සමිතියේ ලේකම් වෙත ඉදිරිපත් කර ඇත්ද යන්න සම්බන්ධයෙන් මෙම චක්‍රලේඛයේ 02 වන ඡේදයේ පරිදි පරීක්ෂාකර සමිතියේ ලේකම් විසින් සහතිකයක් ඉදිරිපත් කිරීම අනිවාර්ය වේ.

04. එසේ වූවද සමුපකාර සමිති රීති මාලාවේ 21.(iv) රීතියේ සඳහන් විධිවිධාන වලට යටත්ව, ඔබ සමිතියේ අනුමත අතුරු ව්‍යවස්ථාවේ සඳහන් විධිවිධාන අනුව එලෙස තේරී පත් වන හෝ පත් කරනු ලබන/ නම් කරනු ලබන නිලධාරීන් ලබා දිය යුතු ප්‍රකාශ/ ලේඛණ සම්බන්ධයෙන් වන විධිවිධාන අනුව අවශ්‍ය පරිදි කටයුතු කිරීමද ඔබගේ වගකීමක් වේ.

05. තවද ඉහත සඳහන් ඕනෑම ආකාරයකින් පත් වන සමුපකාර සමිතියක සභාපතිවරයා විසින් හා කාරක සභාවේ සෑම සාමාජිකයෙක් විසින්ම, 1983 අංක 32 හා 1992 අංක 11 දරන පනත් වලින්

සංශෝධිත 1972 අංක 05 දරන සමුපකාර සමිති පනතේ 66අ.(1) වගන්තිය ප්‍රකාරව ධූරයට පත්වූ පසු හා ඉන් පසුව ධූරය දරන තාක් නියමිත දින හෝ ඊට පෙර වත්කම් හා බැරකම් ප්‍රකාශ දිස්ත්‍රික් භාර සමුපකාර සංවර්ධන සහකාර කොමසාරිස් වෙත ඉදිරිපත් කල යුතු බවට පත්වන /පත් කරනු ලබන/ නම් කරනු ලබන නිලධාරීන් දැනුවත් කිරීමටද ඔබ විසින් කටයුතු කළ යුතුය.

- මෙහි සඳහන් නිලධාරීන් හා කාරක සභාව යන්න සම්බන්ධයෙන් 1972 අංක 05 දරන සමුපකාර සමිති පනතේ අර්ථ නිරූපණය අදාල වේ.

ටී.ජී සරත් කුමාර,
සමුපකාර සංවර්ධන කොමසාරිස්/රෙජිස්ට්‍රාර්,
සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව,
දකුණු පළාත.

ටී. ජී. සරත් කුමාර
සමුපකාර සංවර්ධන කොමසාරිස්/රෙජිස්ට්‍රාර්
සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව

පිටපත්-

| | |
|---|---|
| 01.සහකාර කොමසාරිස්(ගාල්ල/මාතර/හම්බන්තොට)- | අදාල සියළුම සමුපකාර සමිති දැනුවත් කිරීම සඳහා මෙන්ම සමිති භාර නිලධාරීන් ඇතුළු සියළුම නිලධාරීන්ට අවශ්‍ය උපදෙස් ලබා දීම සඳහා (විශේෂයෙන් ඡන්ද නිලධාරීන් වශයෙන් පත් කරනු ලබන නිලධාරීන් මඟින් ඉහත ධූරයන් සඳහා ඉදිරිපත් වන අපේක්ෂකයින් ඡන්ද දැන්වීම මඟින් පූර්වයෙන් දැනුවත කිරීම සඳහා) මෙන්ම අත්සන් සහතික කිරීමේදී මේ පිලිබඳ අවධානය යොමු කිරීම සඳහා |
| 02.සියළුම සමිති භාර නිලධාරීන් - | අදාල සියළුම සමුපකාර සමිති දැනුවත් කිරීම සඳහා හා මෙම චක්‍රලේඛයේ සඳහන් විධිවිධාන අනුව කටයුතු සිදු වන්නේදැයි පරීක්ෂා කිරීම සඳහා මෙන්ම අත්සන් සහතික කිරීම සඳහා නිර්දේශ කිරීමේදී මේ පිලිබඳ අවධානය යොමු කිරීම සඳහා |
| 03. සමුපකාර සමිති සාමාන්‍යාධිකාරීන්/කළමණාකරුවන් | මෙම උපදෙස් අනුව කටයුතු කිරීම සඳහා හා පත්වන සියළුම ප්‍රාදේශීක හෝ දිස්ත්‍රික් කාරක සභිකයින්, කාරක සභිකයින්. අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින් දැනුවත් කිරීම සඳහා |

# දිවුරුම් ප්‍රකාශය

.................................................................................................... (ලිපිනය) දරන ස්ථානයේ පදිංචි ......................................................................................... (සම්පූර්ණ නම) (ජාතික හැඳුනුම්පත් අංකය) වන මම බෞද්ධාගම්කාරයකු/ ක්‍රිස්තියානි භක්තිකයෙකු/ ඉස්ලාම් භක්තිකයෙකු /හින්දු භක්තිකයෙකු වශයෙන් සත්‍ය ලෙසත්, අවංකවත්, ගරු ගාම්භීරතා පූර්වකවත්, ප්‍රතිඥා දී/දිවුරුම් දී ප්‍රකාශ කර සිටින වගනම්,

1. මෙම ප්‍රතිඥා ප්‍රකාශයේ මින් මතුවට සඳහන් සැම සියලු සම්ප්‍රකාශයක්ම මාගේ පෞද්ගලික දැනීම සහ මා සන්තකයේ ඇති ලේඛන ආශ්‍රයෙන් ප්‍රකාශ කර සිටිමි.
2. ලියාපදිංචි අංක ........................ යටතේ .......................... දිනැතිව ලියාපදිංචි කරන ලද .............................................................................. සමිතියේ කාරක සභාවට/ අධ්‍යක්ෂ මණ්ඩලයට/ දිස්ත්‍රික් කාරක සභාවට/ ප්‍රාදේශික කාරක සභාවට පත් වූ/ පත් කරන ලද/ නම් කරන ලද මම යථා පරිදි එම ධූරයට පත් වූ බව ප්‍රකාශ කර සිටිමි.
3. සමුපකාර සමිති පනතේ, 1973 සමූපකාර රීති මාලාවේ 21 රීතියේ, සමිතියේ අනුමත අතුරු ව්‍යවස්ථාවේ හා 297/7 දරන 1977.12.28 දිනැති අති විශේෂ ගැසට් පත්‍රයේ ප්‍රකාශිත "සමුපකාර සමිතිවල ප්‍රාදේශික කාරක සභාවක් තෝරා පත් කිරීමේ නියෝග" වල සඳහන් සමුපකාර සමිතියක ධූරයක් දැරීමට අදාල නුසුදුසුකම්වලින් නොපෙලෙන බවට ප්‍රකාශ කර සිටිමි.

ඉහත නම් සඳහන් දිවුරුම් ප්‍රකාශකහට ඉහත දිවුරුම් ප්‍රකාශය කියවා තේරුම් කර දීමෙන් අනතුරුව සත්‍ය බවට පිළිගෙන ප්‍රකාශ කොට ප්‍රතිඥා දී අත්සන් කරන්නට යෙදුනේ 2023 ක් වූ (මාසය) මස (දිනය) වන දින (ස්ථානය) දීය.

මා ඉදිරිපිට දීය

..........................................

සාම විනිසුරු/ දිවුරුම් කොමසාරිස්

(නිල මුද්‍රාව)